ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව
விளையாட்டு அபிவிருத்தித் திணைக்களம்
**DEPARTMENT OF SPORTS DEVELOPMENT**

නො.09 , පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07 / இல. 09, பிலிப் குணவர்த்தன மாவத்தை, கொழும்பு 07 / No.09, Philip Gunawardana Mawatha, Colombo 07, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. – DSD/Sports/NSG/GEN/2026

ඔබේ අංකය / உமது இல / Your No. –

දිනය / திகதி – 2026.01.30

**DSD/NSF/Circular - 01/2026**

**සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්**
**පළාත් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම්වරුන්**
**පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂවරුන්**

**<u>50 වන ජාතික මහා ක්‍රීඩා උළෙල - 2026</u>**
**<u>තරග කොන්දේසි හා උපදෙස්.</u>**

01. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සමග ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරනු ලබන 50 වන ජාතික මහා ක්‍රීඩා උළෙල, 2026 වර්ෂයේ දී ද පැවැත්වීමට අවශ්‍ය විධි විධාන සලසා ඇති බව දන්වමි.

02. දිප ව්‍යාප්තව විසිරී සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී කරවා ගනිමින් අදියර හතරක් යටතේ මෙම ක්‍රීඩා තරඟාවලිය පවත්වනු ඇත. එම තරඟ එක් එක් අදියරයන් වල සංවිධානයේදී ඔබගේ සහ ඔබ පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශිය ලේකම්වරුන්, පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන් සහ ක්‍රීඩා නිලධාරීන්ගේ සේවය උසස් මට්ටමින් ලබාදෙනු ඇතැයි අපේක්ෂා කරමි.

03. මීට අමතරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන නිලධාරීන්, ක්‍රීඩා පුහුණුකරුවන් සහ ක්‍රීඩා නිලධාරීන්ගේ සේවය ද මේ සඳහා ඔබ වෙත ලැබෙනු ඇත.

04. ජාතික මහා ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනීමේ අරමුණ පෙරදැරිව පළමු අදියරේ සිට ජාතික මහා ක්‍රීඩා උළෙල දක්වාම පවත්වන ඒ ඒ ක්‍රීඩාවන්ට අදාල දිස්ත්‍රික් සහ පළාත් සංගම් සහ ජාතික සංගම්/ සම්මේලන වල සක්‍රීය දායකත්වය ලබා ගනිමින් තරඟාවලිය පැවැත්වීමට තීරණය කර ඇත.

05. ඒ අනුව ප්‍රාදේශිය හා දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ක්‍රීඩා තරඟාවලි සඳහා එම ක්‍රීඩාවට අදාල ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන වලට අනුබද්ධිත දිස්ත්‍රික් ක්‍රීඩා සංගම් වල සහාය ද, පළාත් හා ජාතික මට්ටමේ දී පවත්වනු ලබන තරඟාවලි සඳහා ජාතික සංගම්/ සම්මේලන වල සහාය ද ලබා ගැනීමට අපේක්ෂා කරණු ලැබේ.


අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General – Tel 2697936 / Fax 269182
අධ්‍යක්ෂ (ආයතන හා මිනුම්) / பணிப்பாளர் (நிர்வாகம்) – Tel. 2677960
අධ්‍යක්ෂ (ක්‍රීඩා) / பணிப்பாளர் – Tel. 26942213
ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் – Tel. 2697001 / ...31
කාර්යාලය (සාමාන්‍ය) / அலுவலகம் (பொது) / Office (General) – Tel. 2697934 / Fax. 2695822
Email : info@dosd.gov.lk / departmentofsportsdevelopment@gmail.com
Website : https://dosd.gov.lk

6. ඉදිරියේදී ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන වල ක්‍රියාකාරිත්වය මැන බැලීමට එක් මිනුම් දණ්ඩක් ලෙස අදාල ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන ජාතික මහා ක්‍රීඩා උළෙල සාර්ථක කර ගැනීමට ලබා දෙන දායකත්වය සැලකිල්ලට ගනු ලැබේ.

එස් අව්වුදන්
ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

01. ගරු තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා - කාරු.දැ.ගැ.පි.
02. ගරු ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා - කාරු.දැ.ගැ.පි.
03. ගරු තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා - කාරු.දැ.ගැ.පි.
04. ලේකම්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.පි.
05. දිස්ත්‍රික් ලේකම්වරු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි.
06. සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික තරුණ සේවා සභාව - කාරු.දැ.ගැ.පි.
07. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනය - කාරු.දැ.ගැ.පි.
08. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා උත්තේජක මර්ධන නියෝජ්‍ය ආයතනය - කාරු.දැ.ගැ.පි.
09.අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යායතනය - කාරු.දැ.ගැ.පි
10.. ප්‍රාදේශිය ලේකම්වරු, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි
11.අධ්‍යක්ෂ, ජාතික යොවුන් සේනාංකය - කාරු.දැ.ගැ.පි.
12.සියළුම මාණ්ඩලික නිලධාරීන්, තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය - කාරු.දැ.ගැ.පි.
13.සියළුම මාණ්ඩලික නිලධාරීන්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව -කාරු.දැ.ගැ.පි.
14.පුස්තකාලයාධිපති/ ලේඛකාධිකාරී, ජාතික ක්‍රීඩා විද්‍යායතනය - කාරු.දැ.ගැ.පි./අ.ක.ස.
15.සියළුම දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි/ අ.ක.ස.
16.සියළුම දිස්ත්‍රික් ක්‍රීඩා සංවර්ධන නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි./අ.ක.ස.
17.සියළුම ක්‍රීඩා පුහුණුකරුවන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි./අ.ක.ස.
18.සියළුම ක්‍රීඩා නිලධාරීන්, ප්‍රාදේශිය ලේකම්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කාරු.දැ.ගැ.පි./අ.ක.ස.

CamScanner